ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : CTF/02/2021

2021 ඔක්තෝම්බර් මස 11 දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**ප්‍රධාන ලේකම්වරුන්,**
**දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන්, පොලිස්පති**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සභාපති/භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,**
**සහ ප්‍රාදේශීය ලේකම්වරුන්,**

**කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම**

සංවර්ධන ප්‍රමුඛතාවයන් සහ පෞද්ගලික ව්‍යවසායන් වෙනුවෙන් මෙන්ම කුඩා, ස්වයං රැකියා සහ පාරම්පරික වෘත්තීන්හි නියැලෙන්නන්ගේ ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් යොදාගැනීම සහ ඒවා ලබාගැනීමේ මූලාශ්‍ර හා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් 2020 ඔක්තෝම්බර් මස 06 දිනැති අංක 2196/28 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව පත් කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ඉදිරිපත්කරන ලද නිර්දේශ සැලකිල්ලට ගෙන, එකී භූ සම්පත් කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම සඳහා පැවති ක්‍රියාවලිය තුළ මහජනතාව, පෞද්ගලික ආයතන මෙන්ම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ද මුහුණ දුන් අසීරුතාවයන් මග හරවා පරිසරය සුරකෙන පරිදි බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියක් හඳුන්වාදීමට 2021.10.05 දිනැති අංක අමප.21/1766/301/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලබා දුන් නියෝගය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නව ක්‍රමවේදය පිළිබඳව උපදෙස් අඩංගු කර සකස් කරන ලද "ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිතා කරන ඛනිජ කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ  කාර්ය සංග්‍රහය" සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව, සියලුම ආයතන ප්‍රධානීන් විසින් කළුගල්, වැලි, පස්, බොරලු හා මැටි කැණීම, ප්‍රවාහනය හා වෙළඳාම ක්‍රමවත් කිරිම සඳහා අවශ්‍ය පියවර නොපමාව ගත යුතුය. එහිදී පහත සඳහන් කරුණු සම්බන්ධව ඔබගේ විශේෂ අවධානය යොමු විය යුතුය.

**01.** **කැණීම් කළ හැකි ස්ථාන සහ අවකාශය හඳුනා ගැනීම.**

භූ සම්පත් කැණීම් කල හැකි ස්ථාන පිළිබඳ කල් ඇතිව හඳුනා ගැනීම, ඒවා සිතියම්ගත කිරීම, එම භූ සම්පත් අයත්වන ආයතන හඳුනාගැනීම හා අවශ්‍ය නිෂ්කාශන සහතික ලබා ගැනීම වැනි කාර්යයන් ඒකීය ආයතනික ව්‍යූහයක් තුළ ක්‍රියාත්මක විමට ඉහත සඳහන් ජනාධිපති කාර්ය සාධක බලකාය යෝජනා කර ඇත. ඒ අනුව මීට අදාළ වන සියලුම ව්‍යස්ථාපිත රාජ්‍ය ආයතන මෙතෙක් හුදෙකලාව ක්‍රියාත්මක කරනු ලැබූ ක්‍රමවේද වෙනුවට ඒකීය ක්‍රමවේදයක් තුළ කටයුතු කිරිම සඳහා අවශ්‍ය පරිපාලන ව්‍යූහයන් ගොඩනැගීම/ ප්‍රතිසංස්කරණ කිරීම කළ යුතුය.

ගාලු මුවදොර, කොළඹ 01 | காலி முகத்திடல், கொழும்பு 01 | Galle Face, Colombo 01
දුරකථන | தொலைபேசி | Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් | தொலைநகல் | Fax: ++ 94 11 2446657
ඉ-තැපැල | மின்-அஞ்சல் | e-mail: prsec@presidentsoffice.lk

**02.** **කැණීම් අවසර පත්‍ර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය.**

"ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිතා කරන ඛනිජ කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහයේ" පරිච්ඡේදයන්වල සඳහන් උපදෙස් අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මෙතෙක් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව ක්‍රියාත්මක කරනු ලැබූ වැඩපිළිවෙල සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමටත් සේවාලාභීන්ට පහසුකම් සැලසීමටත් අනවශ්‍ය ලෙස සේවාලාභීන් ආයතන කිහිපයකින් නිෂ්කාශන ලබා ගැනීම වැලැක්වීමටත් එසේම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පහළ මට්ටමේ නිලධාරින් දක්වා අවශ්‍ය උපදෙස් ලබා දෙමින් මෙම ක්‍රියාවලිය මැනවින් සංවිධානය කිරීමටත් ක්‍රියා කළ යුතුය. යෝජනා කර ඇති පරිදි දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරින් හා වෙනත් නිලධාරින් වෙත අවශ්‍ය බලතල පවරා දීමටත් ඔවුන්ට අවශ්‍ය වන නීතිමය ලියවිලි ලබා දීමටත් නොපමාව පියවර ගත යුතුය.

**03.** **රාජ්‍ය ඉඩම් හිමිකාරිත්වය/ කළමනාකාරිත්වය දරන ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉඩම් පරිහරනය සඳහා පරිසර ඇගයීම් සහතික නිකුත් කිරීම.**

කළුගල්, වැලි, පස්, බොරලු සහ මැටි සම්බන්ධව කටයුතු කරන පෞද්ගලික ව්‍යවසායකයින් හා පාරම්පරික වෘත්තීන්වල නියැලෙන්නන්ගේ බරපතල ගැටලුවක් වන්නේ විවිධ ආයතනවල එකඟතා ලබා ගැනීමේදී ඒ සඳහා වැඩි කාලයක් මිඩංගු කිරීමට සිදුවීමත් ඇතැම් අනුමැතීන් සඳහා ආයතනවල ප්‍රධාන කාර්යාල වෙත යැමට සිදු වීමත්ය. බොහෝ ආයතනවල නිෂ්කාශන සහතික නිකුත් කිරීම සඳහා විවිධ වූ සංකීර්ණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමත් දැකිය හැකි වේ. මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු අතර පරිසරය සුරැකීම සඳහා අවධානය යොමු කරමින් මෙම නිෂ්කාශන සහතික ලබා දීම සරල කිරීම සඳහා ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන පියවර ගතයුතු වේ. එසේම ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිර්දේශ කර ඇති නියමිත කාලසීමාව තුල අදාල නිෂ්කාශන හෝ පරිසර සහතික ලබා දීමට ක්‍රියා කල යුතුය. ඇතැම් අවස්ථාවල මේ සම්බන්ධව දැනට පවතින රෙගුලාසි, ගැසට් නිවේදන, චක්‍රලේඛ සංශෝධනය කිරීමට අවශ්‍ය වීමට ඉඩ තිබේ. ඊට අවශ්‍ය අනුමැතිය අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති බැවින් එවැනි සංශෝධන ඇත්නම් ඒවා නොපමාව සම්පූර්ණ කිරීමට අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් ක්‍රියා කළ යුතුය.

**04.** **ගාස්තු අය කිරීම, ආපසු ගෙවීම හා ගිණුම්ගත කිරීම.**

සේවාලාභීන් වෙත පහසු හා සරල සේවාවක් ලබා දීමේ අරමුණ ඇතිව භූ සම්පත් කැණීම් සඳහා මැදිහත්ව කටයුතු කරන සියලු රාජ්‍ය ආයතන විසින් අයකරනු ලබන ගාස්තු ඒකීය ක්‍රමවේදයක් තුළට ගොනු කර ඇත. ඒ අනුව කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර අදාළ සියලුම රාජ්‍ය ආයතන වෙනුවෙන් ගාස්තු අයකිරීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් සිදු කරන අතර එම මුදල් පරිසර අමාත්‍යාංශය යටතේ ඇති අනුමත අය ශීර්ෂයක් වෙත බැර කළ යුතුය. මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් දෙන ලද උපදෙස් පරිදි මෙම මුදල් ඒ ඒ ආයතන වෙත ආපසු ගෙවීමට කටයුතු කරනු ඇත. ඒ අනුව එම උපදෙස් වලට අනුගතව සියලුම ආයතන ප්‍රධානීන් ක්‍රියා කළ යුතු බවට මෙයින් උපදෙස් දෙමි. එසේම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිතා කරන ඛනිජ කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහය මඟින් නියම කර ඇති ගාස්තු හැර, මීට අදාලව මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවයක් නොමැතිව වෙනත් ගාස්තු පැනවීම හෝ ගාස්තු සංශෝධනය කිරීම සිදු නොකිරීමට වග බලා ගත යුතුය.

**05. පාරිසරික ගැටලු, මහජන විරෝධතා හා අධීක්ෂණය**

භූ සම්පත් කැණීම් කිරිමේදී පාරිසරික ගැටළු පැන නැඟීමත් ඒ මත මහජන විරෝධතා මතු වීමත් ඒවාට අවශ්‍ය විසඳුම් ලබා දීමේදී ආයතන අතර සම්බන්ධීකරණයේ දුර්වලතාත් පවතින බව පෙනේ. එවැනි තත්ත්වයක් පැවතීම රජයේ විශේෂ සංවර්ධන කාර්යයන් හා පරිසර ගැටළු නිසි පරිදි කළමනාකරනය කර ගැනිමට බාධාවක්ව පවති. එමනිසා ඒ සම්බන්ධව ජනාධිපති කාර්ය සාධක බලකාය ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරිමටත් මහජන විරෝධතා කළමනාකරණය කිරිමටත් සියලු ආයතන ඒකාබද්ධ ප්‍රයත්නයක නියැලිය යුතු බවට මෙයින් උපදෙස් දෙමි. මේ සඳහා දිස්ත්‍රික් හා ජාතික වශයෙන් පිහිටුවා ඇති අධීක්ෂණ කමිටු නොපමාව රැස්වී අවශ්‍ය තීරණ ගත යුතු බව දන්වා සිටිමි.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති ඉහත කී ක්‍රමවේද සඳහා උපරිම සහයෝගයක් සියලුම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවලින් ලබා ගැනිම සඳහා අවශ්‍ය අඛණ්ඩ වැඩපිළිවෙළක් හා අධීක්ෂණයක් පරිසර අමාත්‍යාංශය විසින් සිදු කල යුතු අතර එහිදී යම් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් අවශ්‍ය සහයෝගය ලබා නොදෙන්නේ නම් ඒ පිළිබඳ පූර්ණ වාර්තාවක් මා වෙත සැපයීමට ක්‍රියා කළ යුතුය.

**පී.බී. ජයසුන්දර**
ජනාධිපති ලේකම්

පිටපත්

1. **අග්‍රාමාත්‍ය ලේකම්** : කාරු. දැ. ගැ. ස.
2. **විගණකාධිපති** : කාරු. අ. ක. ස.
3. **සම-ලේකම්**, ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය : කාරු. දැ. ගැ. ස.
4. **ලේකම්**, භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය : කාරු. අ. ක. ස.